බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>My Number | USJP/EEX-05/2024 | ලිපිනය<br>Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල<br>Post Box 10, Gangodawila<br>නුගේගොඩ, ශ්‍රී ලංකා<br>Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය<br>Your Number | | | |
| දුරකථනය<br>Telephone | 011-2801481, 011-3132496 | වෙබ් අඩවිය<br>Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස්<br>Fax | 011-2802753 | විද්‍යුත් තැපැල<br>E-mail | exam.edecu@sjp.ac.lk |


2024-04-17

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

## වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය (නව විෂය නිර්දේශය) 2015/2017/2018/2019 පුනර් අපේක්ෂකයින් සඳහා අයදුම්පත් කැඳවීම -2024

**01.** ඉහත පරීක්ෂණයට පුනර් අපේක්ෂකයින් සඳහා අයදුම් කිරීමට සහ පරීක්ෂණ ගාස්තු ගෙවීමට පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි.

| | |
|---|---|
| පුනර් පරීක්ෂණ අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය | www.external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය "V" අකුර රහිතව යෙදීමෙන් (Download) කරගත හැක. |
| **පුනර් පරීක්ෂණ ගාස්තු** | එක් විෂයයක් සඳහා රු. 5000.00<br>විෂයයන් 2ක් සඳහා රු. 7000.00<br>විෂයයන් 3ක් සඳහා රු. 9000.00<br>විෂයයන් 4ක් සඳහා රු.11000.00<br>විෂයයන් 5ක් සඳහා රු.13000.00<br>විෂයයන් 6ක් සඳහා රු.15000.00 |
| 2023 අගෝස්තු පවත්වන ලද උපාධි III පරීක්ෂණයට අයදුම් කර වෛද්‍ය හේතු මත විභාගයට වරප්‍රසාද ලැබූ 2019 වර්ෂයේ ලියාපදිංචි අපේක්ෂකයන්ද පරීක්ෂණ ගාස්තු ගෙවීම අනිවාර්ය වේ. | |
| අයදුම්පත් යොමුකළ යුතු ලිපිනය | සහකාර ලේඛකාධිකාරි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලියපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. |
| අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය | 2024 මැයි 31 |
| පුනර් අපේක්ෂකයින් පහත සඳහන් පරිදි ලියාපදිංචිය දීර්ඝ කිරීම අනිවාර්ය වේ.<br><br><u>2015 වර්ෂයේ ලියාපදිංචි සිසුන්</u><br>**2023-02-28 දින දක්වා**<br><u>2017 වර්ෂයේ ලියාපදිංචි සිසුන්</u><br>**2023-09-30 දින දක්වා**<br><u>2018 වර්ෂයේ ලියාපදිංචි සිසුන්</u><br>**2023-09-30 දින දක්වා**<br><u>2019 වර්ෂයේ ලියාපදිංචි සිසුන්</u><br>**2023-08-31 දින දක්වා** | **2015 වර්ෂයේ ලියාපදිංචි සිසුන්ගේ වලංගු කාලය 2023.02.28 දිනෙන් අවසන් වන බැවින් උපාධි III පරීක්ෂණය සඳහා පෙනී සිටිමට ලැබෙන අවසාන අවස්ථාව මෙය බව කරුණාවෙන් සලකන්න.**<br><br>**ලියාපදිංචිය දීර්ඝ කිරීම පිලිබඳ විස්තර www.external.sjp.ac.lk වෙබ් අඩවියේ external.sjp.ac.lk/ B.Com (General) External Degree/Registration/Renewal වෙත පිවිස ලබාගත හැක.** |

## 02. සැලකිය යුතුයි

I. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් අනතුරුව, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතුවේ.

II. <u>2017/2018 සහ 2019 වර්ෂවල ලියාපදිංචි සිසුන් උපාධි III පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරික සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. එසේ ගෙවා නොමැති අයදුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>

III. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2024/05/31** වන අතර එම දිනයෙන් පසුව කිසිඳු හේතුවක් මත අයදුම්පත් භාරගනු නොලැබේ.

IV. පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවෙකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. පරීක්ෂණ ගාස්තු ගෙවීම, දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් සිදුකළ හැක. ( ගෙවීම් කළ පසු අදාළ රිසිට් පතෙහි ඡායා පිටපතක් ළග තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංක වලට ගෙවන ලද මුදල් පිලිබඳව විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.)

V. නියමිත පරිදි මුදල් නොගෙවන ලද අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. පරීක්ෂණයට අදාළ කාල සටහන www.external.sjp.ac.lk යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරිම් වෙබ් අඩවිය හරහා පමණක් සිදුකරන බැවින් නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය කිරිම අත්‍යවශ්‍ය වේ.

VII. විදේශගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ EDECU online Distance Supervision Exam සඳහා පෙනී සිටිය හැක. ඒ සඳහා වන විස්තර http://external.sjp.ac.lk/online-examinations-for-migrated-students/ යන වෙබ් අඩවියෙන් ලබාගත හැක.

VIII. **නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍ර external.sjp.ac.lk/ B.Com (General) External Degree/Examinations/Admission Card වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය V අක්ෂරය රහිතව ඇතුලත් කිරීමෙන් ලබාගත හැකි අතර <u>විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.</u>**

IX. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 09/2021 අනුව ඔබට අදාල උපාධි සහතිකය සහ විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනය නිකුත් කරනුයේ ඔබ විසින් බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේදී ඉදිරිපත් කරන ලද උප්පැන්න සහතිකයේ සඳහන් නමට පමණි. ඒ අනුව විභාග අයදුම්පත සමග ඇති අයදුම් පත්‍ර අංක 01 නිවැරදිව සම්පූර්ණ කර උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක් සමග එවිය යුතුවේ.

<u>උපාධියක් සම්පූර්ණ කිරීම: උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන්</u>

උපාධියක් ලැබීමට, සිසුවෙකු විසින් පහත කරුණු සපුරාලිය යුතු වේ.

- සම්භාර පැය 90 ක් සම්පූර්ණ කර තිබීම, සහ
- එක් එක් අධ්‍යයන වර්ෂයක් සඳහා අවම වශයෙන් 2.00 ට නොඅඩු GPA මට්ටමක් ලබා තිබීම, සහ
- සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා අවම වශයෙන් 2.00 නොඅඩු GPA මට්ටමක් ලබා තිබීම, සහ
- අසමත් ශ්‍රේණි ('D' **හෝ** 'E') නොතිබීම, සහ
- එක් අධ්‍යයන වර්ෂයක් සඳහා දුර්වල **ශ්‍රේණි** ('C-' **හෝ** 'D+') එකකට නොවැඩිවීම, සහ
- සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා වන දුර්වල **ශ්‍රේණි** ('C-' **හෝ** 'D+') සංඛ්‍යාව 03 නොඉක්මවීම, සහ
- සම්භාර රහිත පාඨමාලාව සඳහා 'සමත්' ('C' **ශ්‍රේණිය**) ලබා තිබීම, සහ
- ප්‍රථමයෙන් විශ්වවිද්‍යාලයට බැඳුන අධ්‍යයන වර්ෂයේ සිට උපරිම වශයෙන් වසර **(07)** ක් ඇතුලත ඉහත දක්වා ඇති සියලු අවශ්‍යතාවන් සපුරා තිබීම.

සහකාර ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2024/04/17